

# 18

# මා දුටු මුල් හිරු පෙන්නූ ලංකා

දේශාභිමානය යනු දේශය පිළිබඳ ආඩම්බරය, ගර්වය, මානය යන්න යි. තම මාතෘ භූමියේ සංස්කෘතික උරුමයත් අතීත සෞභාග්‍යය මෙන් ම ස්වභාව සෞන්දර්යය පිළිබඳ අසන්නට ලැබීමෙන් සැම පුරවැසියකු තුළ ම දේශාභිමානී හැඟීම් පහළ වීම නියත ය. "මා දුටු මුල් හිරු පෙන්නූ ලංකා" යන්න එවන් දේශාභිමානී හැඟීම් දනවන ගීතයකි, මේ ගීතය හැත්තෑව දශකයේ ගුවන්විදුලියේ ස්වදේශීය සේවය මගින් ඉදිරිපත් කරන ලද "එඩිතර ලංකා" නම් වූ වැඩසටහනට ඇතුළත් වූවකි.

ගීතයේ රචකයා වූ කරුණාරත්න අමරසිංහ සුප්‍රසිද්ධ ජනමාධ්‍යවේදියෙකි. පරිවර්තකයකු, ගීත පද මාලා රචකයකු හා ළමා පොත් නිර්මාණකරුවකු ලෙස ද අමරසිංහ ප්‍රසිද්ධියට පත්ව ඇත. ප්‍රවීණ ටෙලි නාට්‍ය පිටපත් රචකයකු වන අමරසිංහ ගුවන්විදුලි නාට්‍ය රැසක් සඳහා රංගනයෙන්ද දායකත්වය සපයා තිබේ.

කෙනෙකුට ජීවිතයේ එක් වරක් පමණක් ලබා ගත හැකි සිග්නීස් සම්මානයෙන් ද (2005) කරුණාරත්න අමරසිංහයෝ පිදුම් ලැබූහ.

## මා දුටු මුල් හිරු පෙන්නූ ලංකා

මා දුටු මුල් හිරු පෙන්නූ ලංකා
මා දුටු මුල් සඳු පෙන්නූ ලංකා
මා ගත් මුල් සුසුමත් දුන් ලංකා
මා පණ මෙන් ඔබ රක්නෙමි ලංකා

අත් හළ පුත් කැල සිහි කොට ලංකා
ඔබ හෙළු දුක් සෝ සුසුමන් ලංකා
මහ රෑ මහ සයුරෙන් විත් ලංකා
ඔබ රක්නා දිරි වඩවයි ලංකා

මා නෙත ඔබ නිති බලනට ලංකා
මා කන ඔබ දුක අසනට ලංකා
මා සිත ඔබ ගුණ රඳනට ලංකා
මා දිවි ඔබ රැක ගැනුමට ලංකා

මා ගත ලේ බිඳු එක් කොට ලංකා
නළලත තිලකය අන්දමි ලංකා
මා ගත ඩා බිඳු එක් කොට ලංකා
ඔබ උර මුත්හර බන්දමි ලංකා

### අවබෝධය

1. ලංකාව තමා උපන් දේශය බව දැනවීම සඳහා රචකයා යොදා ඇති කාව්‍යෝක්තිය කුමක් ද?
2. ලංකාව අත් හැර ගිය අය ගැන ලංකාව දුක් වන බව පැවසීම සඳහා යොදා ඇති කවි පදය කුමක් ද?
3. රට වෙනුවෙන් ජීවිතය පරිත්‍යාග කරන බව පැවසෙන කවිය කුමක් ද?
4. "මා ගත ලේ බිඳු එක් කොට, මා ගත ඩා බිඳුවක් කොට" යන පදවලින් අදහස් වන්නේ කුමක් ද?
5. මවුබිම පිළිබඳ අභිමානවත් හැඟීම් දැනවෙන පද්‍ය පාඨ උපුටා දක්වන්න.

## ප්‍රායෝගික අභ්‍යාස

1. මේ දේශාභිමානී නිර්මාණ ද කියවන්න. ගායනා කරන්න.

ලංකා ලංකා පෙම්බර ලංකා
පිනවමු ඔබ ලංකා
හොබවමු ඔබ ලංකා දිවි දී
සුරකිමු ඔබ ලංකා -අරිසෙන් අහුබුදු

රත්නදීප ජන්ම භූමි
ලංකා දීප විජය භූමි
මේ අපේ උදාර වූ
මාතෘ භූමියයි -මහගම සේකර

සසර වසන තුරු - නිවන් දකින තුරු
පින්කෙත හෙළ රන් දෙරණේ
යළි උපදින්නට
හේතු වාසනා වේවා - හේතු වාසනා
-ඩෝල්ටන් අල්විස්

2. "මම මගේ රටට ආදරෙයි" යන්නෙන් වචන 150ක පමණ රචනයක් ලියන්න.
3. දේශාභිමානී හැඟීම් දනවන පද්‍යයක් නිර්මාණය කරන්න.
4. කණ්ඩායම්වලට බෙදී මේ දේශාභිමානී ගීය ගායනා කරන්න.
5. දේශාභිමානී ගී පද මාලා එක් රැස් කර පොත් පිංචක් සකස් කරන්න.